# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. } ඊඩී/05/69/03/05/76

ඔබේ අංකය / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2018.07.6

චක්‍රලේඛ අංකය - 25/2018

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් /
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් /

**<u>වතු පාසල් වැඩිදියුණු කිරීම සඳහා සමාගම් යටතේ පාලනය වන රාජ්‍ය වතුවලින් ඉඩම් ලබාගැනීම</u>**

උක්ත කාරණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී, රජයේ ඉඩම් ආඥා පනත සහ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මගින් සලසා ඇති විධිවිධාන හා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් කාලානුරූපීව නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ උපදෙස් හා විධිවිධානයන්ට අමතරවයි.

වතු පාසල් වැඩි දියුණු කිරීම සඳහා සමාගම් යටතේ පාලනය වන රාජ්‍ය වතුවලින් ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ අංක 2018/ඊඩී/ඊ/05 හා 2018.04.04 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2018.04.25 දිනැතිව ලබාදුන් අංක අමප/18/0714/742/010 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වතු පාසල් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කළයුතු බව මෙයින් දන්වමි.

(අ) වතු පාසල්වලින් දැනට අක්කර 02 ක උපරිම ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳින වතු පාසල්වල සංවර්ධන කටයුතු එම අක්කර 02 තුළ සිදු කිරීමට හා අත්පත් කර ගැනීමෙන් එම ඉඩම් අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීම.

(ආ) දැනට අක්කර 02 ක ඉඩම් ප්‍රමාණයකට අඩුවෙන් භුක්ති විඳින වතු පාසල් සඳහා උපරිම අක්කර 02 සීමාව දක්වා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ලබාදීමේ දී, එම පාසල්වලට යාබදව ඇති අඩු වගා ඵලදායිතාවයක් ඇති ඉඩම් (තේ / රබර්) තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදී සමස්ථ අක්කර 02 හි ඉඩම් ප්‍රමාණය අත්පත් කර ගැනීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා ගැනීම.

(ඇ) ඉහත (අ) හා (ආ) හි සඳහන් පරිදි ඉඩම් අත්පත් කර ගැනීමට පෙර ප්‍රාදේශීය වැවිලි සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාවය ඇතිව අදාළ වතුවල ස්වර්ණමය කොටස් (Golden Share) හිමිකරුවන් වන භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්

පිටපත් :-

01. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
02. ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
03. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
04. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශය
06. ලේකම්, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
07. සියලුම දිසාපතිවරුන්
08. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව